**නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 2018**

---

නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ කණු මතින් ඉදිවන අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුලින් රථවාහන තදබදය, ගමන් කාලය අඩු කිරීම, ආයෝජන හා රැකියා අවස්ථා වැඩිදියුණ කිරීම මෙන්ම දරිද්‍රතාව සහ විරැකියාව අවම කිරීමෙන් ආර්ථික කටයුතු මත ධනාත්මක බලපෑම් ඇති කිරීමයි.අදියර I හි අපේක්ෂිත පිරිවැය රුපියල් බිලියන 55 ක් ඇතුළත පවතින බව තීරණය වී තිබුණු අතර එහි ඉදිකිරීම් කටයුතු 2021 නොවැම්බර් මස වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 මතය

මාගේ මතය,ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශණයන් තුළින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

## 1.4 මතය සඳහා පදනම

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම ,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම පාලනයට සම්බන්ධ අය සතුවේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණවේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රීලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවධානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- හෙළිදරව්කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලන චෝදනා ඇති අය සමඟ මම සන්නිවේදනය කරමි.

## 2 භෞතික කාර්ය සාධනය

### 2.1 ව්‍යාපෘති කාර්යයන්ගේ භෞතික වර්ධනය

2016 මාර්තු 02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලද නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කණු මතින් දිවෙන මහා මාර්ග ඉදිකිරීමේ යෝජනාවට අනුව මහා මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා වූ කිලෝමීටර් 6.9 ක් සහ රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා කිලෝමීටර් 10.4 ක් ලෙස අදියර 02 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. පළමු අදියර යටතේ වූ ශක්‍යතා අධ්‍යනය හා සැලසුම් 2015 වර්ෂයේදී දක්ෂිණ මහා මාර්ග ව්‍යාප්ති ව්‍යාපෘතිය යටතේ අවසන් කර ඇත. දෙවන අදියර සඳහා ශක්‍යතා අධ්‍යනය පිළියෙල කිරීමේ කොන්ත්‍රාත්තුව 2018 මැයි 01 දින රුපියල් මිලියන 98.7 ක වියදමින් විදේශීය සහයෝගිතාවයෙන් යුත් පුද්ගලික සමාගමකට ප්‍රදානය කර ඇත. කෙසේ වෙතත් මහජන විරෝධයේ ප්‍රතිඵලයක් ලෙස සැලැස්ම නිතර වෙනස්කිරීම හේතුවෙන් දින 294 ක ප්‍රමාදයක් සහිතව අවසන් වාර්තාව 2019 අගෝස්තු 22 දින භාරදී තිබුණි. මහාමාර්ග ඉදිකිරීමේ කටයුතුවල කොන්ත්‍රාත්තුව ගොඩනැගීම, ක්‍රියාත්මක කිරීම, මාරුකිරීමේ පදනම යටතේ

ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ. එම නිසා 2018 දෙසැම්බර් 31 දින වන විට පොලී ප්‍රකාශණ 23 ක් ලැබී ඇති අතර 2019 සැප්තැම්බර් 30 දක්වා පොලී ප්‍රකාශණ ඇගයීමට පියවර ගෙන නොතිබුණි.

**2.2** ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු

------------------------------------

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය 2016 වර්ෂයේදී ආරම්භ කර ඇති අතර මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව 2019 සැප්තැම්බර් 30 වන විටද ලබාගෙන නොතිබුණි. තවද මාර්ග සංවර්ධන අධිකාරිය රුපියල් මිලියන 3.71 ක වියදමින් පිළියෙල කිරීමට එකඟ වූ නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරී සැලැස්ම වර්ෂ 2.5 කට වැඩි ප්‍රමාදයකින් යුක්තව 2019 ජනවාරි මස අවසන් කිරීම ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීම ප්‍රමාද වීමට හේතු විය. | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේදී ප්‍රමාදයන් ඇති විය හැකි වීම. | ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචිකිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා එකතුකරන ලද දත්ත ප්‍රමාණවත් නොවන බව සොයාගත් අතර එය නිවැරදි කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. | පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |

2.3 ඌණ උපයෝජිත සම්පත්

----------------------------

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙහි මුළු වෙන්කිරීම් රුපියල් මිලියන 400 න් රුපියල් මිලියන 288.25 ක් රේඛිය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන අනෙකුත් ව්‍යාපෘති වෙත මාරුකර ඇති | මූල්‍ය කළමනාකරණය පිළිබඳ දුර්වල පාලනය. | නිසි පරිදි ප්‍රතිචාර ලබාදී නොමැත. | අරමුදල් කාර්යක්ෂමව උපයෝජනය සඳහා පුළුල් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු අතර ඒ අනුව ප්‍රතිපාදන ඉල්ලා සිටිය යුතුය. |

බව නිරීක්ෂණය විය. තවද සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් නොමැතිකම හේතුවෙන් ප්‍රතිපාදනවලින් සියයට 13 ක් වන රුපියල් මිලියන 53.03 පමණක් උපයෝජනය කර තිබුණි.